# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය / Date: 2026.09.30 පැය 2120 | දුරකථන අංකය / Tel.NO: 011-2887973 | මගේ අංකය / My NO: D/Media/Out/1594 /2026 | විද්‍යුත් ලිපිනය / E-Mails: dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්ෂණික ණය ලබාගැනීමේදී ණය කොන්දේසි සම්බන්ධව මහජනතාව දැනුවත්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවය.**

අන්තර්ජාලය භාවිතා කරමින් සමාජ මාධ්‍ය තුල දැන්වීම් පල කර ජංගම දුරකථන යෙදවුම් මගින් මාර්ග ගත ක්‍රමය ඔස්සේ ක්ෂණික ණය ලබාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මකව පවතී.

මෙම ආකාරයට ණය මුදල් ලබා ගනු ලබන ගනුදෙනුකරුවන් ඔවුන් විසින් එසේ ලබාගත් ක්ෂණික ණය ආපසු ගෙවීමේදී ඉහළ පොලී අනුපාතයක් යටතේ ණය වාරික අය කර ගනිමින් ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත්වන ආකාරයට එම ආයතන කටයුතු කරන බවට ලද තොරතුරු අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් විමර්ශන ආරම්භ කර ඇත.

එම විමර්ශනයට අනුව ණය ගැණුම්කරුවන් අදාල ආයතන වෙතින් ණය ලබා ගැනීමේදී ණය ලබා ගන්නා පුද්ගලයින් ආයතන කොන්දේසි පිළිබඳව නිසි අවබෝධයකින් තොරව ණය ලබා ගැනීම සිදුකිරීම හේතුවෙන් මෙලෙස අපහසුතාවයට පත්ව ඇති බව නිරීක්ෂණය වේ.

මෙම ආයතන දක්වා ඇති කොන්දේසිවල ණය මුදල් ආපසු අය කර ගන්නා ආකාරය සම්බන්ධව හා මෙම යෙදවුම් භාවිතයෙන් ඇතිවිය හැකි සියලු අවදානම් සම්පූර්ණයෙන්ම ණය ගැනුම්කරු විසින් දැරිය යුතු බවට පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව ණය ලබාගන්නා පුද්ගලයන් විසින් නිසි පරිදි කොන්දේසි කියවීමකින් හා නිවැරදි අවබෝධයකින් තොරව මෙම යෙදවුම් ස්ථාපිත කර ණය ගැනීමට කටයුතු කර ඇති බවට වැඩිදුරටත් නිරීක්ෂණය වී ඇත.

එබැවින් මාර්ග ගත ක්‍රමය ඔස්සේ ණය මුදල් ලබා ගැනීමේදී පුද්ගලයින් විසින් සැලකිලිමත්ව හා නිසි අවබෝධයෙන් කටයුතු කිරීම තුලින් සිදු වන අපහසුතාවයන් මග හරවා ගැනීමට හැකි වන අතර ඉහත කරුණු සම්බන්ධයෙන් දැනුවත්ව සිටින ලෙසට පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

මාර්ග ගත ක්‍රමය ඔස්සේ ඉහත ආකාරයට යම් පුද්ගලයෙකුට ණය ලබා ගැනීමට අවශ්‍යතාවයක් තිබේ නම් අදාල ආයතනය විසින් දක්වා ඇති කොන්දේසි සම්බන්ධයෙන් හරියාකාරව ලබාගත් අවබෝධයකින් පසුව අදාල ණය පහසුකම් ලබා ගැනීම තුලින් සිදු විය හැකි අපහසුතාවය මග හරවා ගැනීමට හා මූල්‍ය අලාභයන් වළක්වා ගැනීමට හැකියාව පවතින අතර ඒ සම්බන්ධයෙන් නිසි දැනුවත් වීමකින් කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

මේ සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය ආයතනය මගින් මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**